**ශීර්ෂය 239 - විදේශ සම්පත් දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 239 - විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂය තුළ වියදම් දැරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනවල ඉතිරිවීම් ඇත්නම් සාම්ප්‍රදායිකව සිදු කරන පරිදි ඒවා වර්ෂය අවසන් වීමට පෙර වෙනත් වියදම් සඳහා යොදවා නොගත යුතු බව දක්වා තිබුණද, වැය විෂයයන් 13 කට අදාළව ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් එකතුව රු.7,451,000 ක ප්‍රමාණයක් සියයට 0.42 සිට සියයට 440 දක්වා පරාසයකින් මුදල් රෙගුලාසි 66/69 යටතේ ප්‍රතිපාදන වැඩිකරගෙන තිබුණි. | රට තුළ දැඩි ආර්ථික අස්ථායීතාවක් පැනනැඟුන බැවින්, උද්ධමනය සියයට 50 ක් පමණ ඉහළ අගයක් ගන්නා ලද අතර, එබැවින් 2021 වර්ෂයේ ඇස්තමේන්තුව සකස් කිරීමේදී පැවති මිල ගණන් විශාල වශයෙන් ඉහළ යාම හේතුවෙන්, 2022 වර්ෂය සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූණි. එබැවින්, වර්ෂය තුළ වියදම් දැරීම සඳහා වැය විෂයන් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනවලින් වියදම් අවම වූ වැය විෂයන් වලින් ඉතිරි වූ ප්‍රතිපාදන වලින් වර්ෂය අවසන් වීමට පෙර මු.රෙ. 66 මාරු කිරීම් කර, අදාළ වියදම් සිදුකරන ලද්දේ දෙපාර්තමේන්තුවේ කාර්යයන් අඛණ්ඩව පවත්වාගෙන යා යුතු බැවිනි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | වැය විෂයය අංක 239-1-1-1505 (සම්මාදම් හා දායක මුදල්) ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු.174,000,000 වූ අතර, අධි ප්‍රතිපාදන සලසා ගැනීම හේතුවෙන් සියයට 44.5 ක ප්‍රමාණයක්, එනම් රු.7,451,000 ක් වෙනත් වැය විෂයයන් වෙත මාරු කර තිබුණි. | සම්මාදම් දායක මුදල් ගෙවීම නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් අනුමැතියට යටත්ව ප්‍රතිපාදන ඉල්ලුම් කල අතර, රට තුළ පැවති විදේශ විනිමය ප්‍රමාණවත් නොවූ බැවින්, සම්මාදම් දායක මුදල් ගෙවීම් සීමා කිරීම හේතුවෙන් ඒ සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ඉතිරි විය. අත්‍යවශ්‍ය වියදම් පියවා ගැනීම සඳහා අයවැය දෙපාර්තමේන්තුව හා මුදල් අමාත්‍යාංශයේ අනුමැතියට යටත්ව ඉතිරි ප්‍රතිපාදන මාරු කරගන්නා ලද්දේ දෙපාර්තමේන්තුවේ කාර්යයන් අඛණ්ඩව පවත්වාගෙන යා යුතු බැවිනි. | මු.රෙ. 50 ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු නිවැරදිවත්, තාර්කික ලෙසත් පිළියෙල කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පුනරාවර්තන වැය විෂයයන් 11 ක් අධි ප්‍රතිපාදන සැලසීම හේතුවෙන් වර්ෂය තුළ උපයෝජනය කළ පසු රු.103,809,754 ක ඉතිරියක් පැවති අතර, එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 14 සිට සියයට 92 අතර පාරාසයක ප්‍රතිශතයක් ගෙන තිබූ බව නිරීක්ෂණය විය. | විදේශ ගමන් වියදම් සීමාකිරීම, රටතුළ පැවති ඉන්ධන හිඟය හේතුවෙන් රාජකාරී ගමන් සීමාවීම, වාහන නඩත්තු කටයුතු සිදුකිරීම සීමාකිරීම, පවත්වනු ලබන රැස්වීම් Zoom තාක්ෂණය හරහා පැවැත්වීම නිසා සංග්‍රහ සඳහා යන වියදම සීමාවීම හා භාණ්ඩ මිල ඉහළයාම හේතුවෙන් සුළු නඩත්තු කටයුතු සීමා වීම, රට තුළ පැවති විදේශ විනිමය ප්‍රමාණවත් නොවූ බැවින් සම්මාදම් දායක මුදල් ගෙවීම් සීමා කිරීම, මාණ්ඩලික නිලධාරීන් සඳහා දේපළ ණය ගෙවීම නතර කිරීම, අදාළ වවුචර්පත් අදාළ ආයතනය විසින් ඉදිරිපත් කර නොමැති වීම, ස්ථාවර වත්කම් මිලදී ගැනීම සීමා කිරීම හා ආනයන සීමා පැනවීම, ඉන්ධන සැපයීම සීමාවීම හේතුවෙන් වාහන භාවිතය අවම වීම වැනි හේතුන් ප්‍රතිපාදන ඉතිරිවීම් සඳහා බලපා තිබුණි. | මු.රෙ. 50 ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු නිවැරදිවත්, තාර්කික ලෙසත් පිළියෙල කළ යුතු වීම. |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අගෝස්තු 11 දින මියගිය නිලධාරියෙකුගෙන් හා 2021 ජුලි 20 දින සේවය අතහැරගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු එකතුව රු.428,726 ක ණය ශේෂය අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද අපොහොසත් වී තිබුණි. | මරණ පාරිතෝෂිතයේ හිමිකාරිත්වය පිළිබඳ තීරණයකට එළැඹීමෙන් අනතුරුව අදාළ මරණ පාරිතෝෂිත ගෙවීමට අනුමැතිය ලබාදෙන බවත්, එසේ අනුමැතිය ලැබීමෙන් පසුව රජයට අයවිය යුතු ණය ශේෂ කපාහැරීමට හැකියාව ලැබෙන බවත්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් දැනුම් දෙන ලදි.<br><br>2021.07.20 වන දින වැඩ තහනම් කරන ලද නිලධාරිනියගෙන් රජයට අයවිය යුතු ආපදා ණය හිඟ ශේෂය නිරවුල් කරන ලෙස නිලධාරිනිය වෙත 2023.03.16 දිනැති සිහිකැඳවීම් ලිපිය මගින් ලිඛිතව දැනුම් දී ඇත. | අවශ්‍ය සියලු පියවර ගෙන හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 2.3 බැදීම් හා බැරකම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක (iii) හි කිසිඳු බැරකමක් දක්වා නොමැති නමුත් විගණනයට ඉදිරිපත් කරන ලද 2023 ජනවාරි හා පෙබරවාරි වවුචර් පරීක්ෂා කිරීමේදී සමාලෝචිත වර්ෂයට අදාල රු.468,221 ක බැරකම් හා බැදීම් පැවති බව නිරීක්ෂණය විය. | 2022.12.31 දිනට අදාළව ගෙවිය යුතු අතැති බිල්පත් මඟහැරීමකින් සටහන් කිරීමට නොහැකි වූ බැවින්, එය බැරකම් ලේඛනයේ සටහන් කර ඇත. | ඉදිරි වර්ෂයේදී නිරවුල් කිරීමට අපේක්ෂාවෙන් එළඹ තිබුණු බැරකම් නිවැරදි ලෙස මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කළ යුතු වීම. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 අප්‍රේල් 26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 හි (3)(X) ඡේදය ප්‍රකාරව, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් යටතේ මාණ්ඩලික නිලධාරින් වෙත ලබා දෙනු ලබන ණය පහසුකම් 2022 වර්ෂය අවසන් වන තෙක් අත්හිටුවිය යුතු වුවත්, එම චක්‍රලේඛයේ විධිවිධානයන්ට පටහැනිව දෙපාර්තමේන්තුව විසින් මාණ්ඩලික නිලධාරියෙකුට රු.169,825 ක ආපදා ණය ලබා දී තිබුණි. | පවතින ආර්ථික අවපාත තත්ත්වය යටතේ මෙම නිලධාරිනිය පිලිබඳව සානුකම්පිතව සලකා බලා එම ආපදා ණය මුදල් ලබාදුන් අතර, මෙවැනි අතපසුවීම් ඉදිරියේදී සිදු නොවීමට වගබලා ගනිමි. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරමින් පවතින CS-DRMS ණය කළමනාකරණ පද්ධතිය, ණය සේවාකරණ පුරෝකතන ඇතුළු කාර්යයන් සඳහා හඳුන්වා දී ඇති පද්ධතියක් බවත් ඒ අනුව ණය පිළිබඳ දත්ත ITMIS වෙත මාර්ගගත ක්‍රමයට යොමුකිරීම පිළිබඳව අදාල ආයතන සමඟ සාකච්ඡා සැලකිය යුතු ප්‍රමාණයක් සිදු කලද, තාක්ෂණික ගැටළු හේතුවෙන් දැනට CS-DRMS පද්ධතිය ITMIS සමඟ සම්බන්ධ | නව ණය කළමනාකරණ පද්ධතියක් මිලදී ගැනීම කෙරෙහි අදාළ තාක්ෂණික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, ණය කළමනාකරණය සම්බන්ධ අදාළ පාර්ශ්වයන්ගේ දත්ත අවශ්‍යතා විධිමත්ව කැඳවීම (ITMIS ද ඇතුළුව) | යාවත්කාලීන කළ ගිණුම්කරණ හා මුදල් ප්‍රවාහ පහසුකම් සහිත පද්ධතියක් |

කිරීම දුෂ්කර කාර්යයක් වී ඇති බවත් විගණනයට දන්වා තිබුණි. ඒ අනුව, ණය කළමනාකරණ කටයුතු සමඟ මුදල් ප්‍රවාහ කළමනාකරණය හා ණය ගණුදෙනු ගිණුම්ගත කිරීමේ පහසුකම් සහිත හා/හෝ CS-DRMS පද්ධතියෙන් ITMIS පද්ධතියට අවශ්‍ය දත්ත හුවමාරු කළ හැකි පහසුකම් සහිත වූ ණය කළමනාකරණ පද්ධතියක් හඳුන්වාදීමට දෙපාර්තමේන්තුව 2023 මැයි මාසය අවසන් වන විටත් ක්‍රියාකර නොතිබුණි.

ආදී කරුණු මෙන්ම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග එළඹි වැඩසටහන මගින් යෝජනා කර ඇති ණය ප්‍රතිව්‍යුගත කරන ක්‍රියාවලිය සිදුකිරීමේ පහසුකම් සලකා බැලීම හා ණය කළමනාකරණය සම්බන්ධ ඉදිරි අවශ්‍යතා බලපානු ලබන බැවින්, එවැනි හැකියාවක් හා තිරසාර තාක්ෂණික සහායක් ඇති ජාත්‍යන්තර වශයෙන් පිළිගත් පද්ධතියක් මිලදී ගැනීම සඳහා ක්‍රියා කෙරේ. ඒ සඳහා භාණ්ඩාගාර ලේකම් විසින් පත්කර ඇති කමිටුව රැස්වී උක්ත කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඉදිරි ක්‍රියාමාර්ග සාකච්ඡා කර මේ වනවිට අවශ්‍ය වාර්තා සකසමින් පවතී.

පවත්වා ගත යුතු වීම.

(ආ) 2022 වර්ෂයේ කාර්යසාධන සැලැස්මට අනුව ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුව සහ සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම පහත පරිදි විය.

| **සංවර්ධන පාර්ශ්වකරු** | **ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුව 2022** | **සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම 2022** | **විචලනය** | **විචලනය, ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| --------- | -------- | -------- | ----- | ---------- |
| | **එ.ජ.ඩො. මිලියන** | **එ.ජ.ඩො. මිලියන** | **එ.ජ.ඩො. මිලියන** | **සියයට** |
| ලෝක බැංකුව | 482 | 456.2 | (25.8) | (5) |
| ආසියානු සංවර්ධන බැංකුව | 550 | 741.4 | 191.4 | 35 |
| චීනය | - | 101.3 | 101.3 | |
| ජපානය | - | 75.7 | 75.7 | |
| කොරියාව | - | 4.9 | 4.9 | |
| පෙරදිග ආසියානු රටවල් | 50 | 21.4 | (28.6) | (57) |
| දකුණු ආසියානු | 835 | 925.5 | 90.5 | 11 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| රටවල් | | | | | | |
| රුසියාව, ඕස්ට්‍රේලියාව සහ බටහිර රටවල් | 150 | 76 | (74) | (49) | 2022 වර්ෂයේ ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුව 2022 අප්‍රේල් 12 වැනිදා නිකුත් කරන ලද විදේශ ණය සේවාකරණ ගෙවීම් පිළිබඳව වූ අන්තර්කාලීන ප්‍රතිපත්තිය පිළිබඳව නිවේදනය සමග පැන නැඟි නව තත්ත්වයන්ට අනුගත වෙමින් පසුකාලීනව වෙනස් කරන ලදී. | විධිමත් පරිදි සැලසුම් සහිතව විදේශ ණය මූල්‍යනයන් සිදු කළ යුතු වීම. |
| එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන | 8 | 11.1 | 3.1 | 39 | | |
| **එකතුව** | --------<br>**2,075**<br>==== | --------<br>**2,413.5**<br>==== | ----------<br>**338.5**<br>===== | | | |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2022 වර්ෂයේ ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවේ මුළු වටිනාකම එ.ජ.ඩො. මිලියන 2,075 ක් වුවද, සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම එ.ජ.ඩො. මිලියන 2,413.5 ක් වීම හේතුවෙන් සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම, ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවට වඩා එ.ජ.ඩො. මිලියන 338.5 කින් එනම්, සියයට 16 කින් පමණ වැඩි වී තිබුණි.

| | | |
|---|---|---|
| (ii) ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවට අනුව චීනයෙන්, ජපානයෙන් හා කොරියාවෙන් ණය ලබා ගැනීමට ඇස්තමේන්තු නොකළද, සත්‍ය ණය ගැනීම පිළිවෙලින් එ.ජ.ඩො. මිලියන 101.3, එ.ජ.ඩො. මිලියන 75.7ක් හා එ.ජ.ඩො. මිලියන 4.9ක අගය වී තිබුණි. | අන්තර් කාලීන ප්‍රතිපත්ති නිවේදනයත් සමඟ බොහෝ ණය දෙන රටවල් හා ආයතන විසින් දැනට ක්‍රියාත්මක කරමින් තිබූ ව්‍යාපෘති සඳහා අරමුදල් ප්‍රතිලබ්ධි කිරීම අත්හිටුවන ලදී. අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ ශ්‍රී ලංකාවට යෝජනා කරන ලද වැඩසටහනට අනුගත වෙමින් ණය ප්‍රතිව්‍යුහගත කළ පසු නැවත සුපුරුදු පරිදි ව්‍යාපෘති සඳහා විදේශ ණය ප්‍රතිලබ්ධීන් සිදු කිරීම ආරම්භ කළ හැකි වෙතැයි අපේක්ෂා කෙරේ. | විධිමත් පරිදි සැලසුම් සහිතව විදේශ ණය මූල්‍යනයක් සිදු කළ යුතු වීම. |
| (iii) ආසියානු සංවර්ධන බැංකුවෙන්, දකුණු ආසියානු රටවල් හා එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන යන රටවල් වලින් ලබා ගත් ණයවල සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුව සමඟ සසඳන විට, පිළිවෙළින් සියයට 35, 11 සහ 39 කින් වැඩි වී තිබුණි. | පැවති ඩොලර් අර්බුදයට පිළියමක් ලෙස ආසියානු සංවර්ධන බැංකුව හා ලෝක බැංකුව වැනි බහු පාර්ශ්වීය ණය දෙන ආයතන විසින් ශ්‍රී ලංකාවේ සංවර්ධන ව්‍යාපෘති සඳහා ලබාදුන් මූල්‍ය පහසුකම් වලින් කොටසක් නැවත අරමුණුගත (repurpose) කොට | විධිමත් පරිදි සැලසුම් සහිතව විදේශ ණය මූල්‍යනයක් සිදු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | එම අරමුදල් අත්‍යවශ්‍ය ආනයනය කිරීම් සඳහා යොදා ගැනීමට ක්‍රියා කරන ලදී. එබැවින් මුළු ඇස්තමේන්තු සමග වෙනසක් මේ තුලින් සිදු විය. | |
| (iv) | ලෝක බැංකුව, පෙරදිග ආසියාතික රටවල් සහ රුසියාව, ඕස්ට්‍රේලියාව හා බටහිර රටවල්වලින් ලබා ගැනීමට අපේක්ෂා කළ ණය පිළිවෙළින් සියයට 5, 57 සහ 49 කින් අඩු වී තිබුණි. | ඉන්දියාව ඇතුළු සමහර රටවල් විසින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ පැවති අර්බුදකාරී තත්ත්වය සමනය කිරීමට හදිසි ණය ආධාර වැඩසටහන් හරහා අත්‍යවශ්‍යය ආනයනයන් සිදුකිරීමට අවශ්‍ය අරමුදල් ලබා දීමට එකඟ විය. එම තීරණය 2022 වර්ෂය තුළ සිදුවූ බැවින්, මුල් ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවෙන් සත්‍ය ප්‍රතිලබ්ධීන් වෙනස් වීමට හේතු වී ඇත. | විධිමත් පරිදි සැලසුම් සහිතව විදේශ ණය මූල්‍යනයක් සිදු කළ යුතු වීම. |
| (ඇ) | CS-DRMS ණය කළමනාකරණ පද්ධතියේ අන්තර්ගත දත්තවල අසාමාන්‍යතා හා නොසැසඳීම් | | |
| (i) | ණය ගිවිසුම් දෙකක් සම්බන්ධයෙන් එකතුව රු.1,803,456 ඍණ ණය ශේෂයන් රජයේ මූල්‍ය ප්‍රකාශන වල සහ CS-DRMS 2000+Report 854-1 වාර්තාවෙහි නිරීක්ෂණය විය. | **ණය අංක 2010117 හා 2010121**<br><br>පිළිවෙලින් 1982 හා 1983 වර්ෂවලදී ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබා ගත් ණය මුදල් වන අතර, 2010 වර්ෂයේදී එම ණය එ.ජ.ඩො. විනිමයෙන් විශේෂ ගැනුම් හිමිකම් විනිමයට පරිවර්තනය කර ඇත. එසේ පැවති ශේෂයන් එ. ජ. ඩොලර් විනිමය මඟින් 2022 වර්ෂයේදී ගෙවා අවසන් කිරීමේදී ඇතිවූ විනිමය වෙනස ඍණ අගයයක් ලෙස සඳහන් වේ. මෙම වෙනස මේ වනවිට නිවැරදි කර ඇත. | රාජ්‍ය ණය ගැනීම, ණය සේවාකරණය ගිණුම්ගත කිරීම විධිමත් පරිදි සිදු කළ යුතු වීම. |
| (ii) | ණය ගිවිසුම් හතරක් සම්බන්ධයෙන් එකතුව රු.652,634,243 ක ඍණ ණය උපලබ්ධිවීම් | ප්‍රතිලබ්ධි ආපසු පවරාගැනීම් (Refund) සටහන්ව තිබූ | රාජ්‍ය ණය ගැනීම, ණය |

| | | | |
|---|---|---|---|
| | රජයේ මූල්‍ය ප්‍රකාශන වල සහ CS-DRMS 2000+Report 854-1 වාර්තාවේ දක්වා තිබුණු අතර තවත් ණය ගිවිසුම් දෙකක් සම්බන්ධයෙන් එකතුව රු.154,795,691 ක සෘන ණය උපලබ්ධිවීම් රජයේ මූල්‍ය ප්‍රකාශන වල පමණක් නිරීක්ෂණය විය . | අතර, එය සෘණ අගයයක් ලෙස CS-DRMS දත්ත පද්ධතියේ නිවැරදිව සටහන් කර ඇත. මෙම සෘණ අගයයයන් CS-DRMS හි නිවැරදිව සටහන් කර ඇති අතර, මෙම ප්‍රතිලබ්ධි ආපසු පවරා ගැනීම පිළිබඳව අදාළ ව්‍යාපෘති අධ්‍යක්ෂකගෙන් හා/හෝ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් විමසීමට යෝජනා කරමි. | සේවාකරණය ගිණුම්ගත කිරීම විධිමත් පරිදි සිදු කළ යුතු වීම. |
| (ඇ) | 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව, විදේශ ආධාර සම්බන්ධ සියළු ගණුදෙනු මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කලයුතු බව සඳහන් වුවද, නියැදි පරීක්ෂාවක් මත ලබාගත් තොරතුරු අනුව, 2022 වර්ෂය තුළ එසේ මහා භාණ්ඩාගාරයේ දැනුවත් වීමකින් තොරව වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වෙනුවෙන් ව්‍යාපෘති 20 ක් සඳහා එකතුව රු.1,837,321,420 ක විදේශ ප්‍රදාන සෘජුව ලැබී තිබුණු අතර එම වටිනාකම් ප්‍රතිපාදන සලසාගෙන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරිමට කටයුතු කර නොතිබුණි. | 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරණ විදේශාධාර ගිණුම් තැබීමට අදාල චක්‍රලේඛය හා ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ XI වෙනි පරිච්ඡේදයේ මුදල් රෙගුලාසි 610 මගින් සියළුම රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන වෙත උපදෙස් ලබා දී ඇත්තේ, විදේශාධාර සඳහා වන සියළුම සාකච්ඡා (negotiations) පවත්වනු ලැබිය යුත්තේ හා යම් ව්‍යාපෘතියකට හෝ කාර්යයකට විදේශ ආධාර ලබාගැනීම පිළිබඳ විමසිය යුත්තේ මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් බවයි. ඒ හැර, විදේශ ආධාර සම්බන්ධ සියලුම ගනුදෙනු සිදුකිරීම හෝ අදාල ව්‍යවස්ථාපිත ආයතන වෙත නියෝග නිකුත් කිරීමේ බලයක් මෙම දෙපාර්තමේන්තුව සතු නොවන අතර, ඒ සඳහා වන පිළිගත් පාලන ක්‍රමවේදයක් හෝ කිසිදු විධි විධානයක් මෙම දෙපාර්තමේන්තුව වෙත ලබාදී නොමැත. | ප්‍රදායකයින්ගේ විශ්වාසය ද තහවුරු වන පරිදි ලැබුණු විදේශ ප්‍රදාන අදාළ අරමුණුවලට යෙදවීම පිළිබඳ සම්බන්ධීකරණය හා නියාමනය ශක්තිමත් කළ යුතු වීම. |

## 3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය මඟින් 2017 ජුනි 28 දිනැතිව නිකුත් කරන ලද වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 ප්‍රකාරව, කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලද 2022 දෙසැම්බර් 31 දිනට විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සතු වාහන ලේඛනය සහ දෙපාර්තමේන්තුවේ ස්ථාවර වත්කම් ලේඛනය පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) දෙපාර්තමේන්තුව සතු මෝටර් රථ 13 ක් පැවතුණ ද, ස්ථාවර වත්කම් ලේඛනයේ මගී වාහන ලෙස වටිනාකම රු.59,098,696 ක් වූ මෝටර් රථ 11 ක් සඳහා එම එක් එක් වාහනයේ මෝටර් රථ අංකය යටතේ නොදක්වා පොදුවේ එක වාහන අංකයක් යටතේ දක්වා තිබුණි. ඒ අනුව, දෙපාර්තමේන්තුව සතු වාහන ස්ථාවර වත්කම් ලේඛනය සමඟ නිසි පරිදි හඳුනාගත නොහැකි බව නිරීක්ෂණය විය. | ස්ථාවර වත්කම් ලේඛනයට අදාළ සිගාස් පරිගණක පද්ධතියේ ඇති මෙම වෙනස්කම් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී ඉදිරියේදී නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලදි. | දෙපාර්තමේන්තුව සතු වත්කම් නිවැරදිව හඳුනා ගැනීම හා ලේඛනගත කිරීම කළ යුතු වීම. |
| (ii) දෙපාර්තමේන්තුවේ ස්ථාවර වත්කම් ලේඛනය තුළ ඇතුළත් WP JV-1448 සහ WP KK-5481 මෝටර් රථ දෙක අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව 2022 දෙසැම්බර් 31 දිනට කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලද වාර්තාව තුළ අන්තර්ගත කර නොතිබුණි. තවද, 2022 මැයි 30 වන දින විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ජාතික විගණන කාර්යාලය වෙත ඉදිරිපත් | දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරන ලද WP JV – 1448 හා WP KK – 5481 යන වාහන මුදල් අමාත්‍යාංශය වෙත පැවරීම් කර ඇති අතර, එම වාහන නිකුත් කිරීමේ නියෝග මඟින් මුදල් අමාත්‍යාංශය වෙත භාර දී ඇත. ඊට අදාළව දෙපාර්තමේන්තුවේ ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත්කර, අවශ්‍ය සටහන් යොදා නිවැරදි කරන ලදි. එමෙන්ම මෙම වාහන මුදල් අමාත්‍යාංශයේ වත්කම් ලේඛනවලට ඇතුළත් කරගන්නා ලෙස ලිඛිතව දැනුම් දී ඇත. | දෙපාර්තමේන්තුව සතු වත්කම් නිවැරදිව හඳුනා ගැනීම හා ලේඛනගත කිරීම කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | කරන ලද 2021 වර්ෂයේ විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවට අදාළ පිළිතුරු ලිපියේ මෙම වාහන දෙක මුදල් අමාත්‍යාංශයට භාර දී ඇති බව සඳහන් වුවද, 2022 දෙසැම්බර් 31 දිනට මුදල් අමාත්‍යාංශයේ ස්ථාවර වත්කම් ලේඛනයේ මෙම වාහන දෙක අන්තර්ගත වී නොතිබුණි. එසේම, විගණනයට ඉදිරිපත් කරන ලද බාහිර පාර්ශවයන් වෙත ලබා දී ඇති වාහන පිළිබඳ විස්තර තුළ ද මෙම වාහන අන්තර්ගත වී නොතිබුණි. | | |
| (iii) | 2017 ජුනි 28 දිනැති 01/2017 වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව, කොම්ප්ට්‍රොලර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරන වාර්තාව තුළ මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබා ගත් රු.15,900,000 ක් වටිනා වාහන දෙකක් නිදහස් වත්කම් (Freehold Assets) ලෙස අන්තර්ගත කර තිබුණි. කෙසේවුවත්, එය දෙපාර්තමේන්තුවේ ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කර නොතිබුණි. | අදාළ මෝටර් රථ මූල්‍ය කල්බදු වත්කම් යටතේ සටහන් කිරීමට කටයුතු කර ඇත. | දෙපාර්තමේන්තුව සතු වත්කම් නිවැරදිව හඳුනා ගැනීම හා ලේඛනගත කිරීම කළ යුතු වීම. |
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය (ACA-6) අනුව රු.11,045,533 ක වෙනත් යන්ත්‍ර සහ උපකරණ 2022 වර්ෂය තුළදී අපහරණය කර තිබුණි. කෙසේවෙතත්, එම අපහරණයන් සඳහා වූ නිසි අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවීය. තවද, මෙම අපහරණයන් තුළ අන්තර්ගත සත්‍ය අපහරණයන් හා වැරදි නිවැරදි කිරීම් නිසි ලෙස වර්ගීකරණය කර ගැනීමට ප්‍රමාණවත් විගණන සාක්ෂි ඉදිරිපත් නොවූ අතර, වත්කම් අපහරණය හෝ වැරදි නිවැරදි කිරීම සඳහා වූ අභ්‍යන්තර පාලන විධිවිධාන ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය. | මෙම අපහරණයන් තුළ සත්‍ය අපහරණයන්වල වටිනාකම රු.84,750 ක් වන අතර, ඉතිරි වටිනාකම් අපහරණයන් ලෙස සටහන් වුවද, ඒවා පරිගණක පද්ධතියේ සිදුවූ වෙනස්කම් සඳහා වැරදි නිවැරදි කිරීම් වේ.<br>දෙපාර්තමේන්තුවේ භාණ්ඩ අපහරණය සිදු කිරීම අපහරණ කමිටු යොදා ගනිමින් සිදුකරන අතර, වැරදි නිවැරදි කිරීමේදී යොදා ගන්නා පාලන විධිවිධාන සම්බන්ධයෙන් විගණන නිරීක්ෂණය අනුව කටයුතු කිරීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට සටහන් කරගන්නා ලදි. | වත්කම් අපහරණය සඳහා හා පොත්පත්වල නිවැරදි කිරීම් සිදු කිරීමට විධිමත් පාලන ක්‍රමවේද හඳුන්වා දිය යුතු වීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

### 4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය

| විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂයේ දෙසැම්බර් 31 දින දෙපාර්තමේන්තුවේ පැවති පුරප්පාඩු 20 තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 6ක්, ද්විතීයික මට්ටමේ පුරප්පාඩු 9 ක් සහ ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 5 ක් පැවතුණි. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අදාළ පරිපාලන බලධාරීන් දැනුවත් කර ඇත. ද්විතීයික මට්ටමේ කළමනාකරණ සේවා නිලධාරි පුරප්පාඩු පවතින නමුත්, අවශ්‍යතාවය පරිදි නිලධාරීන් අනුයුක්ත කරගැනීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩ නොමැති වීම මත, එම පුරප්පාඩු සම්පූර්ණ කල නොහැකි වී ඇත. කෙසේ වුවද, දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය පරිදි ඉඩකඩ පුළුල් කරගැනීම සඳහා මුදල් අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කරමින් පවති. ප්‍රාථමික මට්ටමේ කාර්යාල සේවක සේවයේ පුරප්පාඩු සියල්ලම සම්පූර්ණ කර ඇතත්, රියදුරු පුරප්පාඩු හතරක් ඉදිරියේදී සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ඇත. | අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කළ යුතු වීම හා අත්‍යාවශ්‍ය නොවන කාර්ය මණ්ඩලයක් අනුමත කාර්ය මණ්ඩලය තුළ වේ නම් අනුමත තනතුරු සංඛ්‍යාව සංශෝධනය කළ යුතු වීම |